# 4 වන පරිච්ඡේදය
# ශ්‍රී ලංකාවේ භෞතික ලක්ෂණ

## රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශය

සාගර නීතියේ තුන්වැනි වගන්තියට අනුව, ලෝකයේ සෑම වෙරළබඩ රාජ්‍යයකට ම වෙරළ සීමාවේ සිට නාවික සැතපුම් 12ක් නොඉක්මවන සේ මුහුදු සීමාවක් හිමි කර ගැනීමට අයිතියක් ඇත. එම ප්‍රදේශය රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශය යනුවෙන් නම් කෙරේ. (4.1 සිතියම බලන්න). ශ්‍රී ලංකාවේ දේශ සීමාව ලෙස එම රාෂ්ට්‍රීය සීමාව නීත්‍යනුකූල ව පිළිගැනේ. රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශයට අයත් ගුවන-මුහුදු පත්ල හා ඒ අභ්‍යන්තරයේ ඇති පාෂාණ ආදී සියල්ල ම එම රාජ්‍යයට අයිති ය. මෙම රාෂ්ට්‍රීය මුහුදු ප්‍රදේශයේ දූපත්, වැලි වැටි, ගල්පර යනාදී භූ ලක්ෂණ ද දක්නට ලැබේ.

රටකට අයත් මුහුදු සීමාව තීරණය කරන අන්තර් ජාතික සාගර නීතිය 1994 නොවැම්බර් 16 වන දින සිට ලොව පුරා ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකාව එම ගිවිසුමට අත්සන් කරනු ලැබුවේ 1982 දෙසැම්බර් 10 වෙනි දින ය. මෙම ගිවිසුමට අනුව ශ්‍රී ලංකාවට නාවික සැතපුම් 200ක් (340 km)දක්වා අනන්‍ය ආර්ථික කලාපයක් ද හිමි ව ඇත. එම කලාපයේ ජල කඳෙහි ද මුහුදු පත්ලෙහි ද යටි පසෙහි ද සියලු ස්වභාවික සම්පත් සඳහා ශ්‍රී ලංකාවට තනි අයිතියක් ඇත.

ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාව සජීවී හා අජීවී සම්පත්වලින් පොහොසත් ය. ඒවා අතුරින් වැලි, ගල්, කැල්සියම් කාබනේට්, පොටැසියම් වැනි දේ මහාද්වීපික තටකයේ ද පොස්පරයිඩ් මහාද්වීපික බෑවුම්වල ද සොයා ගෙන ඇත.




4.1 සිතියම
ශ්‍රී ලංකාවට අයත් මුහුදු සීමාව
(මූලාශ්‍රය: මිනින්දෝරු දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ජාතික සිතියම් සංග්‍රහය,පාසල් මුද්‍රණය, ඇසුරෙන් සකස් කරන ලදි.

**ක්‍රියාකාරකම 1**

- ශ්‍රී ලංකාවේ රාෂ්ට්‍රීය මුහුදු තීරය සිතියමක ලකුණු කර එම ප්‍රදේශය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වැදගත් වන ආකාරය නිදසුන් මඟින් පැහැදිලි කරන්න.

## භූ විෂමතාව

මුහුදු මට්ටමේ සිට ඇති උස පදනම් කර ගෙන ශ්‍රී ලංකාව භූ විෂමතා කලාප පහකට බෙදා ඇත. 4.2 සිතියම බලන්න. ඒ එක් එක් කලාපයෙහි කැපී පෙනෙන පොදු ලක්ෂණ මුල් කර ගෙන මේ බෙදීම කර ඇත.

1. වෙරළබඩ තැන්න - මුහුදු මට්ටමේ සිට 30m දක්වා
2. අභ්‍යන්තර තැනිතලාව - 30-300m දක්වා
3. මධ්‍ය කඳුකරය - 300m ට වැඩි
4. සබරගමු කඳුකරය
5. ගල් ඔය කඳුකරය

මධ්‍යම කඳුකරයට නිරිත දිගින් සබරගමුව කඳු පන්තිය ද නැගෙනහිරින් ගල්ඔය කඳු පන්තිය ද උස් බිම් කලාප දෙකක් ලෙස පිහිටා ඇත. මෙම කඳු පන්ති 300m ට වඩා උසින් වැඩි ය.




4.2 සිතියම
ශ්‍රී ලංකාවේ භූ විෂමතා කලාප

## වෙරළබඩ තැන්න

ශ්‍රී ලංකාවේ මුහුදු වෙරළෙන් ද, 30m සමෝච්ච රේඛාවෙන් ද, සීමා වන ප්‍රදේශය වෙරළබඩ තැන්නට අයත් වේ. වෙරළබඩ තැන්න උතුරු ප්‍රදේශවල දී පළල් ය. දකුණු ප්‍රදේශයේ දී පටු ය.

මෙම වෙරළබඩ තැනිතලා ප්‍රදේශය තුළ දූපත්, බොකු, කලපු, තුඩු, ඩෙල්ටා, වගුරු ආදි විශේෂිත ලක්ෂණ කීපයක් ඇත.

ශ්‍රී ලංකාවේ වෙරළබඩ විශේෂිත ලක්ෂණ

| | | | |
|---|---|---|---|
| ❒ | දූපත් | - | සම්පූර්ණයෙන් ම ජලයෙන් වට වූ ගොඩබිම දූපතකි. උදා: මන්නාරම |
| ❒ | බොක්ක | - | මුහුදට විවෘත වූ පැත්ත විශාල වූ, ගොඩබිම් දෙසට කා වැදුණු කරදිය පිරුණු මුහුදු ප්‍රදේශය බොක්ක නම් වේ. උදා: ආරුගම් බොක්ක, කොඩ්ඩියාර් බොක්ක. |
| ❒ | කලපුව | - | කලපුව යනු වසරේ එක් කාලයක දී පමණක් මුහුදට සම්බන්ධ වන කිවුල් දිය පිරුණු නොගැඹුරු ජලාශයකි. උදා: පුත්තලම, මඩකලපුව. |
| ❒ | තුඩුව | - | ගොඩබිම මුහුද දෙසට නෙරා ගිය ස්ථානය තුඩුව නමින් හැඳින්වේ. උදා:- දෙවුන්දර තුඩුව, පේදුරු තුඩුව |
| ❒ | ඩෙල්ටාව | - | ගංගා සමහරක් මුහුදට ගලා බසින ස්ථානයේ දී ශාඛා කීපයකට බෙදී ගලා බසී. ගංගාවෙන් ගෙනෙනු ලබන රොන්මඩ අවානක හැඩයට තැන්පත් වීමෙන් සැදුණු බිම් ප්‍රදේශය ඩෙල්ටාව නම් වේ. උදා : මහවැලි ගඟේ ඩෙල්ටාව. |
| ❒ | වගුරු | - | පහත් බිමක ජලය ගලා නො ගොස් රැඳී පැවතීම නිසාත්, ගංගාවක ජලය පිටාර ගලා ඒ අවට රැඳීම නිසාත් වගුරු බිම් ඇති වේ. උදා : මුතුරාජවෙල වගුරු බිම, සෝමාවතී වගුරු බිම. |
| ❒ | දඹ | - | වෙරළ ආශ්‍රිත ව ඇති ප්‍රපාතාකාර බෑවුමකි. ඛාදනයට අපහසු තද පාෂාණවලින් නිර්මාණය වී ඇත. උදා: ගාල්ල රුමස්සල, ත්‍රිකුණාමලය |

ක්‍රියාකාරකම 2

❒ විෂයභාර ගුරුතුමා/ගුරුතුමියගෙන් උපදෙස් ලබා ගනිමින්, ශ්‍රී ලංකාවේ භූ විෂමතාව දැක්වෙන ත්‍රිමාන ආකෘතියක් නිර්මාණය කරන්න.

## ▶▶ අභ්‍යන්තර තැනිතලාව

උස අනුව 30**m** සමෝච්ච රේඛාවත් 300**m** සමෝච්ච රේඛාවත් අතර පිහිටි තැනිතලා බිම අභ්‍යන්තර තැනිතලාවට අයත් ය. 4.3 සිතියම බලන්න. මෙම තැනිතලාවේ උතුරු, වයඹ, ඊසාන කොටස් පළලින් වැඩි ය. දකුණ, නිරිත හා නැගෙනහිර කොටස් පටු ය. දිගු කලක් සෝදා පාළුවට ගොදුරු වීම නිසා තැනින් තැන ශේෂ කඳු (හුදකලා කඳු) ඇත. මිහින්තලය, රිටිගල, කතරගම ආදිය ඊට නිදසුන් ය.



4.3 සිතියම
අභ්‍යන්තර තැනිතලාව

## ▶▶ මධ්‍ය කඳුකරය

4.4 සිතියමෙන් මධ්‍ය කඳුකරයේ කඳු පන්තින් දැක්වේ. අනෙක් විෂමතා කලාප දෙකට ම වඩා මෙම කලාපය සංකීර්ණ ය. දළ වශයෙන් 300m ඉහළ උසක් ඇත. යටිකුරු කරන ලද ඉංග්‍රීසි T අකුරක (⊥) හෝ නැංගුරමක හැඩය ගත් කඳු පංතියකින් යුක්ත ය. එම නැංගුරම් පාදයේ බටහිරින් සමනළ කන්ද (2237m) ද, නැගෙනහිරින් හපුතලේ නමුනුකුල කඳු පංතිය (2036m) ද පිහිටා ඇත. කිරිගල් පොත්ත (2395m) සහ පිදුරුතලාගල (2524m) මුදුන් අතර ප්‍රදේශය නැංගුරම් කඳ ලෙස සැලකිය හැකි ය. නකල්ස් කඳු නැංගුරමේ සිරස් පාදය යි. මධ්‍ය කඳුකරයේ තවත් විශේෂිත භූ රූප ලක්ෂණයක් ලෙස සානු හැඳින්විය හැකි ය.

හැටන්, වැලිමඩ, මහනුවර හා කොස්ලන්ද සානු ඒ අතර වැදගත් ය. දියළුම, දුන්හිඳ, ලක්ෂපාන ආදී දියඇලි, මධ්‍ය කඳුකරයේ දර්ශනීය බව වැඩි කරයි.

ගලගෙදර, බලන, ගිනිගත්හේන, මධ්‍ය කඳුකරයට පිවිසෙන ප්‍රධාන කපොලු ය. මාර්ග ඉදි කිරීමේ දී වඩාත් වැදගත් වේ. හෝර්ටන් තැන්න, අඹේවෙල තැන්න, සීතා එළිය, හාවා එළිය මධ්‍ය කඳුකරයේ පිහිටි තැනිතලා ප්‍රදේශ වේ. තෘණ භූමි තිබීම නිසා සත්ත්ව පාලනයට යෝග්‍ය වේ.

දුන්හිඳ, දියළුම, ලක්ෂපාන, ඇබර්ඩීන්, වැනි ආකර්ෂණීය දියඇලිවලින් ද මධ්‍ය කඳුකරය සමන්විත ය. ස්වාභාවික සෞන්දර්ය සඳහා මෙන් ම ජල විදුලිය නිපදවීමේ දී ද දිය ඇලි වැදගත් වේ.




4.4 සිතියම
මධ්‍ය කඳුකරයේ කඳු පන්ති



4.1 රූපය
දිය ඇල්ලක්

## සබරගමු කඳුවැටිය




4.5 සිතියම
සබරගමු කඳුවැටිය

මෙම කලාපය මධ්‍ය කඳුකරයත්, අඩතැනි කලාපයත්, අතර මධ්‍ය කඳුකරයට නිරිත දිගින් පිහිටා ඇත. මෙම කඳු බුළුතොට, රක්වාන කඳු ලෙසින් ද හැඳින්වේ. (4.5 සිතියම) වයඹ ගිනිකොන අතට විහිදෙන සමාන්තර කඳුවැටි පෙළක් තිබීම විශේෂත්වයකි. හිනිදුම (661m), කුකුළුගල (704m) හා ගොන්ගල (1358m) මෙහි ඇති සමහර කඳු මුදුන් ය. නිල්වලා, ගිං හා බෙන්තොට යන ගංගා මේ කඳු කලාපයෙන් ආරම්භ වේ. ශ්‍රී ලංකාවේ පැරණි ම වනාන්තරය වූ සිංහරාජ වනාන්තරය පිහිටා ඇත්තේ ද මේ කලාපයේ ය.

## ගල්ඔය කඳු

මධ්‍ය කඳුකරයට නැගෙනහිරින් පිහිටි මෙම කඳු පන්තිය තැනින් තැන විසිරී හුදෙකලාව නැගී සිටින කඳුගැට රාශියකින් සැකසී තිබීම විශේෂ ලක්ෂණයකි. ගෝවින්ද හෙල (වෙස්මිනිස්ටර් ඇබේ) කොකාගල, නුවරගල, ඉඟිනියාගල, මොණරාගල, ඊට නිදසුන් ය. (4.6 සිතියම)

මේ ප්‍රදේශයෙන් ආරම්භ වන ගංගා අතර ගල්ඔය, හැඩඔය හා කුඹුක්කන් ඔය වැදගත් ය.




4.6 සිතියම
ගල්ඔය කඳු පන්තිය

ක්‍රියාකාරකම 3

- ශ්‍රී ලංකාවේ භෞතික ලක්ෂණ, ආර්ථිකය හැඩගැස්වීමට දායක වී ඇති ආකාරය අනාවරණය වන පරිදි අත්පත්‍රිකාවක් සකස් කරන්න.
- සංචාරකයින්ගේ ප්‍රයෝජනයට යොදා ගත හැකි වන සේ ශ්‍රී ලංකාවේ භූගෝලීය පරිසරයේ පිහිටි සෞන්දර්යාත්මක වටිනාකමක් ඇති ස්ථාන පිළිබඳ කුඩා පොතක් සකස් කරන්න.
- මධ්‍ය කඳුකරයේ ආකෘතියක් ගොඩ නගන්න.
- මධ්‍ය කඳුකරයේ විෂමතා ලක්ෂණ ඇසුරින් වගුව සම්පූර්ණ කරන්න.

| මධ්‍ය කඳුකරයේ භූ ලක්ෂණ | නිදසුන් | ප්‍රයෝජන |
|---|---|---|
| | | |

## ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප

ඒකාකාර දේශගුණ සාධක පවතින ප්‍රදේශයක් දේශගුණික කලාපයක් ලෙස හැඳින්වේ. දේශගුණය කෙරෙහි බලපාන උෂ්ණත්වය, සුළං, වර්ෂාපතනය වැනි සාධකවල අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ව සියුම් ව පරීක්ෂා කරන විට ශ්‍රී ලංකාව දේශගුණික කලාප හතරකට බෙදිය හැකි ය. (4.7 සිතියම බලන්න).

1. පහතරට තෙත්
2. පහතරට වියළි
3. කඳුරට තෙත්
4. කඳුරට වියළි
5. අර්ධ ශුෂ්ක ප්‍රදේශ

මෙම වර්ගීකරණයට අනුව වයඹ හා ගිනිකොන දිග කුඩා ප්‍රදේශ අර්ධ ශුෂ්ක ප්‍රදේශ ලෙස හඳුන්වනු ලැබුව ද ශ්‍රී ලංකාවේ ශුෂ්ක ලක්ෂණ හඳුනාගත නොහැකි බැවින් එම ප්‍රදේශ වියළි කලාපයේ ම කොටසක් ලෙස ඇතැම් දේශගුණ වර්ගීකරණවල දක්වා ඇත.

**අර්ධ ශුෂ්ක කලාපය**

- වාර්ෂික වර්ෂාපතනය 650 -1250mm අතර වේ.
- අවුරුද්දකට දින 30 සිට 60 අතර ඉඩෝර කාලයක් පවතී.
- ඔක්තෝම්බර් සිට ජනවාරි දක්වා සංවහන වර්ෂාවෙන් හා වාසුළි මගින් වැසි ලැබේ.
- ලැබෙන වර්ෂාපතනය අඩු ය.
- වාෂ්පීකරණය වැඩි ය.

**පහත රට වියළි කලාපය**

- වර්ෂාපතනය 1250-2000mm අතර වේ.
- දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා ඊසාන දිග මෝසමෙන් වැසි ලැබේ.
- තෙත් හා වියළි කාලයක් පවතී.
- අවිනිශ්චිත වර්ෂාව හා අධික වාෂ්පීකරණය විශේෂිත ලක්ෂණයකි.
- වසරකට දින 30-60 දක්වා ඉඩෝර කාලයක් පවතී.




**කඳුරට තෙත් කලාපය**

- මාතලේ, මහනුවර, නුවරඑළිය, හපුතලේ යන නගර සම්බන්ධ කරමින් රේඛාවක් ඇන්දොත් රට බටහිරින් පිහිටි කලාපය මීට අයත් ය.
- අවුරුද්ද පුරා වැසි ලැබේ. සාමාන්‍ය වර්ෂාපතනය 3000mm පමණ වේ. වැඩි ම වර්ෂාව වටවල, ගිනිගත්හේන, යටියන්තොට, කෙනිල්වර්ත් වැනි ප්‍රදේශවලින් වාර්තා වේ.
- දෙසැම්බර් සිට පෙබරවාරි දක්වා වියළි සුළං ඇති වේ.

**කඳුරට වියළි කලාපය**

- කඳුරට තෙත් ප්‍රදේශයෙන් නැගෙනහිර කොටස මීට අයත් ය.
- සාමාන්‍ය වාර්ෂාපතනය 1750 -2000mm අතර වේ.
- කඳුරට වුව ද, කඳුරට වියළි කලාපය අඩු වර්ෂාවක් ලබන්නේ සුළං මුවාවෙහි පිහිටි නිසා යි.

**පහත රට තෙත් කලාපය**

- සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 2000mm වැඩි, උස 300m පහළ මට්ටමක පිහිටි ශ්‍රී ලංකාවේ නිරිත දිග කලාපය මීට අයත් ය.
- සාමාන්‍ය උෂ්ණත්වය 27°c පමණ වේ.
- මැයි සිට සැප්තැම්බර් දක්වා නිරිත දිග මෝසමෙන් වැසි ලැබේ.
- මාර්තු-අප්‍රේල් සහ ඔක්තෝම්බර්-නොවැම්බර් කාලවල සංවහන වැසි ඇති වේ.
- අවුරුද්ද මුළුල්ලේ ම වාගේ වැසි පවතින නිසා වියළි සෘතුවක් නොමැති තරම් ය.
- පෙබරවාරි සහ අගෝස්තු මාස වඩා වියළි මාස වේ.

4.7 සිතියම
ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප

**ක්‍රියාකාරකම 4**

1. පහත රට තෙත් කලාපය හා පහත රට වියළි කලාපය යන දේශගුණික කලාප දෙකෙහි වෙනස්කම් සසඳන්න.
2. ඔබ ජීවත් වන ප්‍රදේශය අයත් වන භූ විෂමතා කලාපය හා දේශගුණික කලාපය නම් කර එහි භූ විෂමතා ලක්ෂණ හා දේශගුණික ලක්ෂණ මානව ක්‍රියාකාරකම් සඳහා වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.

## ශ්‍රී ලංකාවේ ස්වාභාවික වෘක්ෂලතා

මිනිසාගේ බලපෑම සෘජු ව හෝ අනියම් ව හෝ නො ලැබූ ආදි ශාක වැස්ම ස්වාභාවික වෘක්ෂලතා යනුවෙන් හැඳින්වේ. පස, උෂ්ණත්වය, සූර්යතාපය හා වර්ෂාපතනය යන සාධක වෘක්ෂලතා වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපායි.
(4.8 සිතියමෙන් ශ්‍රී ලංකාවේ ස්වාභාවික වෘක්ෂලතා කලාප හා වර්ෂාපතන ව්‍යාප්තිය දැක්වේ. ස්වාභාවික වෘක්ෂලතා ව්‍යාප්තියට වර්ෂාපතනයේ බලපෑම, වර්ෂාපතන රේඛා දැක්වෙන සිතියම හා සසඳා බැලීමෙන් වටහා ගත හැකි ය.)

### නිවර්තන තෙත් වනාන්තර

- 2000mm වඩා වර්ෂාපතනයක් ඇත.
- පහතරට හා මැදරට තෙත් කලාපයේ ව්‍යාප්ත වී ඇත. සංවර්ධන කාර්යයන්ට යොදා ගැනීම නිසා මුල් ස්වාභාවික වනාන්තරවලින් දැනට ඉතිරි ව ඇත්තේ ජගත් උරුමයක් බවට ප්‍රකාශ කොට ඇති සිංහරාජ වනාන්තරය පමණි
- ශාක විවිධත්වය (උදා:- හොර, නා, කීන, බැදිදෙල් ආදි ශාක) හා ජෛව විවිධත්වය විශේෂිත ලක්ෂණයකි.
- විවිධ උසින් යුත් ශාකවලින් සෑදුණ ස්තර ගණනාවක් ඇත.
- යටිරෝපණය අධික ය.

### වියළි මිශ්‍ර සදාහරිත වනාන්තර

- වියළි කලාපය පුරා පැතිරී ඇත.
- සමහර ගස්වල පත්‍ර හැලීම යම් ඍතුවක දී සිදු වන නිසා වියළි මිශ්‍ර සදාහරිත නම භාවිත වේ.
- 1250 -2000mm දක්වා වර්ෂාව හා මැයි-අගෝස්තු අතර දිගු නියගයක් පැවතීම, එක් කලක දී පමණක් වැසි ලැබීම, අධික වාෂ්පීකරණය හා බැඳුණු උත්ස්වේදනය යන හේතු නිසා වනාන්තර ඝන ව නො වැඩේ.
- බුරුත, කළුවර නැඳුන්, කොහොඹ, පලු වැනි ආර්ථික වටිනාකමක් සහිත ශාක වර්ග ඇත.
- අලියා, ගෝනා, මුවා, වල්ඌරා වැනි සතුන් ද බහුල යි.

### අතර මැදි සදාහරිත වනාන්තර

- තෙත් කලාපයත්, වියළි කලාපයත් වෙන් කරන සීමාව දෙපස පිහිටි වන පටිය යි. මොණරාගල, කුරුණෑගල, තංගල්ල වැනි ප්‍රදේශවල මේ වනාන්තර දක්නට ඇත.
- එනිසා වියළි කලාපයේ හා තෙත් කලාපයේ ශාකවලින් සමන්විත ය. පිහිඹියා, ලුනු මිදෙල්ල වැනි ශාක ඊට නිදසුන් වේ.



4.8 සිතියම
ශ්‍රී ලංකාවේ වෘක්ෂලතා කලාප හා වාර්ෂික වර්ෂාපතන ව්‍යාප්තිය දක්වන සිතියම්

### කඳුකර වනාන්තර

- උස 1200m ඉහළ ප්‍රදේශයේ ව්‍යාප්ත වී ඇත. සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය 2000mm වැඩි ය. උෂ්ණත්වය $22^{o}$ - $24^{o}$c ක් පමණ වේ.
- හෝර්ටන් තැන්න, පිදුරුතලාගල, නකල්ස්, සමනල වැටිය වැනි ප්‍රදේශවල දක්නට ඇත.
- තේ, අර්තාපල් වැනි වගාවන් ව්‍යාප්ත වීම නිසා වනාන්තර ක්‍රමයෙන් අඩු වෙමින් පවතී.

❒ ගස්වල උස 8-10m පමණ වේ. කීන, දඹ, වල්සපු ආදී ගස් වර්ග බහුල ය. අපිශාකමය ඕකිඩ්, පාසි, ලයිකන් ආදිය දක්නට ඇත.

## තණ බිම්

- ❒ පතන තණ බිම්, පිහිටීම හා උස අනුව වර්ග දෙකකි.
  - (i) වියළි පතන - නකල්ස් වැටියේ බටහිර බෑවුම්වල හා ඌව ද්‍රෝණිය තුළ ව්‍යාප්ත වී ඇත. 1250-1900mm දක්වා වර්ෂාපතනයකි. මානා තෘණ විශේෂය බහුල යි.
  - (ii) තෙත් පතන - 1400m ඉහළ කඳුකර උස්බිම්වල ව්‍යාප්ත වී ඇත. හෝර්ටන් තැන්න, සඳතැන්න, සීතාඑළිය, අඹේවෙල, කඳපොල ආදී ප්‍රදේශවල දක්නට ඇත.
- ❒ බිබිල, ලුණුගල, අම්පාර ප්‍රදේශවල ඉලුක් තෘණ වර්ගය බහුල වේ. අරළු, බුලු, නෙල්ලි, ගම්මාලු වැනි ශාක ඇත. මේවා සැවානා තණ බිම් ලෙස නම් කෙරේ.
- ❒ තුනී පස් තට්ටුවක් තිබීම, අවුරුද්දේ වැඩි කලක් වේගයෙන් හමන සුළඟට ගොදුරු වීම හා අඩු වර්ෂාපතනය තෘණ භූමි වර්ධනයට හේතු වේ.

## කටුපඳුරු ලඳු කැලෑ

- ❒ ශ්‍රී ලංකාවේ වයඹ හා ගිනිකොන දිග ප්‍රදේශවල ව්‍යාප්ත වී තිබේ.
- ❒ 1000-1250mm දක්වා වර්ෂාව ද, $27^{0}c$ උෂ්ණත්වයක් ද ඇත.
- ❒ ඊසාන මෝසමෙන් වැසි ලැබේ.
- ❒ මාස හයක් පමණ වූ දිගු නියං කාලයකට ඔරොත්තු දෙන ශාක ඇත. කොළ අඩු යි. පත්‍ර සිහින් උල් හැඩයක් ගනී. හීන් කරඹ, අන්දර, එරමිණිය, කුකුරුමාන්, පතොක් ආදිය බහුල වේ.
- ❒ පොත්ත ඝනකමින් යුත් පලු, වීර වැනි ශාක දක්නට ලැබේ.

## කඩොලාන

- ❒ යාපනය, මුලතිව්, ත්‍රිකුණාමලය, මීගමුව, මඩකලපුව, පුත්තලම ආදී ප්‍රදේශවල පැතිරී ඇත.
- ❒ වෙරළබඩ පරිසරයට අනුවර්තනය වූ ශාක විශේෂයකි.
- ❒ වතුරෙන් උඩට මුල් විහිදී ඇත. අතුවලින් කරුමුල් ද, කඳෙන් කයිරුමුල් ද පැන නගී.
- ❒ කඩොල්, කිරල, ගිංපොල්, කැරන්කොකු, කටුඉකිලි කඩොලාන ශාක සමහරකි.

### ශ්‍රී ලංකාවේ ශාක සම්පත විනාශයට හේතු

- ❖ කෘමි උවදුරු (කුරුමිණියන්, දළඹුවන්, වේයන්, අම්බලංපාලුවන්, කම්බිපණුවන්)
- ❖ කුණාටු, සුළි සුළං
- ❖ අසීමිත ලෙස ගස් කැපීම
  - නිවාස ඉදි කිරීම
  - සංවර්ධන ව්‍යාපාර
  - මාර්ග හා විදුලිය වැනි ඉදි කිරීම් සඳහා.
  - අනවසර දැව කැපීම්
- ❖ ගිනි තැබීම්
  - හේන් ගොවිතැනට ඉඩම සකස් කිරීම
  - සතුන් දඩයම, මී පැණි එකතු කිරීම.

### ශාක සම්පත් සංරක්ෂණ උපාය මාර්ග

- ❖ ගින්නෙන් ආරක්ෂා කිරීම.
- ❖ කෘමි උවදුරුවලින් ආරක්ෂා කිරීම.
- ❖ ප්‍රජාව දැනුවත් කිරීම.
- ❖ නීතිරීති නිසි පරිදි ක්‍රියාත්මක කිරීම.
- ❖ දැව පරිහරණයේ දී සිදු වන නාස්තිය වළක්වා ගැනීම.
- ❖ නැවත වන වගාව.

### ක්‍රියාකාරකම 5

- ❑ වන සම්පත ආරක්ෂා කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන ඇතුළත් ලේඛනයක් සකස් කරන්න.
- ❑ ශාක වර්ධනය කෙරෙහි දේශගුණයේ බලපෑම පැහැදිලි කරන්න.